1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය எனது இல. My Ref.	CSS/8/8/3-2026	ඔබේ අංකය உமது இல Your Ref.	දිනය திகதி Date	2026.10.14

ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙත,

අත්තිකාරම් ගිණුම් කටයුතුවල සීමා සංශෝධන සම්බන්ධවයි.

අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් දකුණු පළාත් මුදල් රීති 365 සිට 383 දක්වා මුදල් රීති කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව දකුණු පළාත් මුදල් රීති 369.3 පරිදි එක් එක් අත්තිකාරම් ගිණුම් කටයුතු නියමිත සීමාවන් ඇතුළත පවත්වාගෙන යා යුතු වන අතර, දකුණු පළාත් මුදල් රීති 369.4ට අනුව සීමාවන් සංශෝධනය කරගැනීමට අවශ්‍ය යැයි දැනගත් වහාම එසේ කිරීමට හේතුවන කරුණු සමඟ අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර සීමා සංශෝධන අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර සීමාව සංශෝධනය කර ගත යුතුය.

03. එම නිසා ඔබගේ අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා අමුණා ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්පූර්ණ කර 2026.11.30 දිනට පෙර පළාත් භාණ්ඩාගාරයට ලැබිය යුතු බව කාරුණිකව දන්වමි.

04. තවද, මෙම අත්තිකාරම් ගිණුම් සීමාවන් නොපිළිපැදීම හේතුවෙන් සෑම වර්ෂයකම විගණන විමසුම්වලට ලක්වන බැවින් මේ සම්බන්ධව විශේෂ අවධානය යොමුකොට අවශ්‍ය සීමාවන් සංශෝධනය කර ගන්නා මෙන් දන්වන අතර, සීමා සංශෝධන සිදු නොකර හෝ පවත්නා සීමාවන් ඉක්මවා කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔබ විසින් පෞද්ගලිකව වගකිව යුතු බව අවධාරණය කරමි.

05. ආදර්ශ ආකෘති පත්‍රය www.cs.sp.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන්ද භාගත කර ගත හැක.

06. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

වන්දිම සී. මුහන්දිරම්ගේ,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

වන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් - 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත - අ.කා.ස
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, ද. ප. - අ.කා.ස
3. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත - අ.කා.ස
4. මුදල් අධ්‍යක්ෂ, දකුණු පළාත - අ.කා.ස
5. ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන ලේකම් කාර්යාලය - අ.කා.ස

ප්‍රධාන ලේකම් பிரதான செயலாளர் Chief Secretary 091 4944002
කාර්යාලය காரியாலயம் Office 091 4119011 091 2234052
ෆැක්ස් தொலைநகல் Fax 091 2246299
විද්‍යුත් තැපෑල மின் அஞ்சல் E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය இணையத்தளம் Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.ඒච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.